ප්‍රශ්නය වන්නේ මීට පෙර අවස්ථා කිහිපයකදී පොලිසියට හා අධිකරණයේ පරස්පර විරෝධි ප්‍රකාශ සිදු කොට ඇති කිසිදු විශ්වාසනීයත්වයක් නොමැති එමෙන්ම අපරාධ වැරදි සම්බන්ධයෙන් විමර්ශනයට ලක්ව ඇති පුද්ගලයෙකුගෙන් ඕස්ට්‍රේලියාවට ගොස් ලබා ගත් ප්‍රකාශයක් මත පදනම්ව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව මෙවැනි අත්අඩංගුවට ගැනීමක් සිදු කලේ කෙසේද යන කාරණයයි.

අප මවබිම තුල දූෂණය පිටු දැකීම සදහා අප පාලන කාලය තුල අප විසින් සම්මත කල දූෂණ විරෝධි නීති කිසිදු සාධාරණත්වයකින් තොරව නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකරමින් දේශපාලන ස්වාධීනත්වයකින් තොරව අපයෝජනය කරනු ලබන්නේ නම් එවැනි අවස්ථාවක නිහඩව නොසිට එයට විරුද්ධව නැගී සිටීමට ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු ජනතාවට අයිතියක් ඇති බවට අප දැඩිව විශ්වාස කරමු.

නාමල් රාජපක්ෂ මැතිතුමාට එරෙහිව නගා ඇති චෝදනා සියල්ල අප පක්ෂයක් ලෙස ප්‍රතික්ෂේප කරන අතර එම චෝදනා පදනම් විරහිත හා දේශපාලනිකව පොළඹවීමක් මත සිදු කරනු ලැබූ චෝදනා බව අපගේ විශ්වාසයයි. පක්ෂයක් ලෙස ශ්‍රී ලංකාවේ ජනතාව වෙත අප අවධාරණය කරන්නේ අප රට තුල තිබිය යුත්තේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන මිස දේශපාලනික න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කරන ආයතන නොවන බවයි.

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විශාල බලතල සහිතව නිර්මාණය කරනු ලැබුවේ ශ්‍රී ලංකාව තුල සිදුවිය හැකි දූෂණ හෝ වංචා පිටු දැකීමට මිස දේශපාලනය සදහා අවියක් ලෙස භාවිතා කිරීමට නොවන බව අවධාරණය කර සිටිමු. තවද රට තුල පිහිටා ඇති ස්වාධීන රාජ්‍ය ආයතන දේශපාලනික තර්ජන සදහා මෙවලමක් වශයෙන් භාවිතා කිරීමට පෙළඹේ නම් මේ රටට සහ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන සියලු පුරවැසියන් ඒ සම්බන්ධයෙන් දැඩි අවධානයක් දැක්විය යුතුය.

**අද දින ඒ නාමල් රාජපක්ෂයන්ය.**

හෙට දින එය පවතින ආණ්ඩුවේ වැරදි විවේචනය කරන ඕනෑම දේශපාලනික නායකයෙකු හෝ සමාජ ක්‍රියාකාරියෙකු හෝ සාධාරනීයත්වය අගයන පුරවැසියෙකු විය හැකිය.

ඒ අනුව මේ රටේ නීතියේ ආධිපත්‍ය සහ යුක්තිය විශ්වාස කරන සියලු පුරවැසියන් සිවිල් සංවිධාන සහ යුක්තිය පසදලීමට සම්බන්ධ සියලු ආයතන සංවිධාන සහ පුද්ගලයින්ගෙන් අප ඉල්ලා සිටින්නේ රාජ්‍ය බලය අවභාවිතය සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන දේශපාලනමය අවශ්‍යතා සදහා යොදා ගැනීමට එරෙහිව හඩ නැඟිය යුතු බවයි.

**පක්ෂයක් ලෙස වත්මන් ආණ්ඩුවට අප පහත කරුණු දැඩිව දක්වා සිටිමු.**

- ඔබට නායකයෙකු සිරගත කල හැකි නමුත් එම නායකයාගේ දර්ශනය මත පදනම්ව ඉදිරියට යන බලවේගය නැවැත්විය නොහැක.
- ඔබට එක් අයෙකුගේ හෝ කිහිප දෙනෙකුගේ හඩ නැවැත්විය හැකි නමුත් සියලු දෙනාගේ හඩ නැවැත්විය නොහැක.
- ඔබට ජනතාව බිය ගැන්වීමට උත්සහ කල හැකි නමුත් සමස්ථ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අභිලාශයන් සිරගත කිරීමට නොහැක.



CamScanner